# කුරුලූ ලෑල්ල



යෙත්මික ශෙනෝල් විජේවර්ධන

CamScanner

# කුරුලු ලෑල්ල

## යෙත්මික ශෙනෝල් විජේවර්ධන

කතා

(පළමු දිගහැරීම)

මහ/ධර්මරාජ විද්‍යාලය

1 ශ්‍රේණිය B

2025-02-08

ISBN 37257

**පිදුම**

***ආදරණීය***

***අම්මටත්, අප්පච්චිටත්, අක්කාටත්***

***සෙනෙහසින් .....***

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.




CamScanner



වත්ත පුරාම ලේන්නු, කුරුල්ලෝ.

එයාලා කෑම හොයනවා.

“තාත්තේ අපි කුරුලු ලෑල්ලක් හදමුද? ” මම ඇහුවා.

“හොඳයි, අපි කුරුලු ලෑල්ලක් හදමු. එන්න. ”තාත්තා කිව්වා.



CS CamScanner



“අක්කා එන්නකෝ...” මම අක්කාව හොයාගෙන දුවගෙන ගියා.

තාත්තා ලෑලි,ලණු,ඇණ මිටි ගෙනාවා.

“අපි තාත්තට උදව් කරමු.”අක්කා කිව්වා.

ලෑලි වලට ලණු දාලා අඹ ගහේ අත්තේ එල්ලන්න තාත්තා ලස්සන කුරුලු ලෑල්ලක් හැදුවා. ඒක එල්ලන්න අපි උදව් කරා.

CS CamScanner



“හරි දැන් පුලුවන් කුරුල්ලොන්ට කෑම දෙන්න ”

තාත්තා කිව්වා.

අම්මා බත්, පළතුරු පිඟානක් ගෙනත් දුන්නා.

අපි ඒවා ලෑල්ලට දැම්මා

අක්කා චූටි කෝප්පෙකට වතුර ගෙනත් තිබ්බා.

දැන් අපි හැංගිලා බලන් ඉමු.

CamScanner

ටික වෙලාවකින් අඹ ගහ දිගේ ලේනෙක් පහළට ආවා. වටපිට බල බල ලෑල්ල උඩ හිටිපු ලේනා කලබලයෙන් බත් කෑවා. අපිට හරිම සතුටුයි.



හවස් වෙද්දි එළියේ කුරුලු සද්දේ ඇහුණ නිසා

අපි එළියට ආවා.



අනේ! කුරුලු ලෑල්ලට මයිනෝ,දෙමළිච්චවෝ,

ලේන්නු ඇවිත්.

චූටි හොටෙන් ඇන ඇන කනවා.

මයිනෙක් වතුර කෝප්පේට

ඔළුව දාලා නානවා.බලන් ඉන්න ආසයි.



CamScanner

අම්මයි,තාත්තවයි එක්කගෙන ඇවිත් අපි කුරුලු ලැල්ල පෙන්නුවා. අපිට හරිම සතුටුයි.

“දැක්කා නේද පුතේ, හොඳ දෙයක් කරාම සිතට කොයි තරම් සතුටක් දැනෙනවද ? ”අම්මා අපේ ඔළුව අතගාමින් කිව්වා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟම දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය සමඟ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නඟා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනවිරත්න මහලේකම්